ජාතික තරුණ සේවා සභාව - 2020
--------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරිමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදයට අනුව කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම ආදායම් හා වියදම් අයිතම ලාභ හෝ අලාභවල ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාල සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු එකතුව රු. 6,790,800 ක්වූ ආරක්ෂක වියදම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ආරක්ෂක වියදම් සඳහා වූ වට්නාකම ගිණුම් සකස් කර අවසන් කරන අවස්ථාව වන විට නිශ්චිතවම හඳුනාගැනීමට නොහැකි වූ නිසා උපචිත වියදම් ලෙස ගිණුම්ගත කිරීමට නොහැකිවිය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වර්ෂයට අදාල වියදම් ගිණුම්ගත කළ යුතුය . |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 1,433,003,346 ක් වූ වත්කම් වර්ග 03 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඉදිරියේදී දළ ධාරණ අගය හෙලිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂය වන විට වැඩ නිමකර භාවිතයට ගෙන ඇති වටිනාකම රු. 17,934,286 ක් වූ ගොඩනැගිලි කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එසේම එම ගොඩනැගිලි වලට අදාල සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු. 896,714 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ඇත. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ)සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ අක්කර 04 පර්චස් 2.25 ක ප්‍රමාණයක් වූ ඉඩම් 05 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඌව පළාත් කාර්යාලය හා බදුල්ල කාර්යාල වල පිහිටි ඉඩමට අදාල තක්සේරු වාර්තාව මේ වන විට ලැබී ඇත.ඒ අනුව එම වටිනාකම 2021 වර්ෂයේ ගිණුම් ගත කිරීමට මේ වන විට කටයුතු කර ඇත. ඉතිරි ඉඩම් සඳහා තක්සේරු වාර්තා 2021 වර්ෂය තුල ලබා ගෙන ගිණුම් ගත කරමි. | සභාවට නීත්‍යානුකූල අයිතිය හිමි වත්කම් වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කිරිමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කෙරීගෙන යන වැඩ වලින් ජනිත වූ මුදල් ප්‍රවාහක් ලෙස රු. **185,808,765** ක් දක්වා තිබුණද කෙරීගෙන යන වැඩ සඳහා සත්‍ය වශයෙන් රු. **149,929,102** ක් පමණක් උපයෝජන කර තිබුණි. ඒ අනුව කෙරීගෙන යන වැඩ සඳහා වූ මුදල් ප්‍රවාහයේ රු. **335,737,868** ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා උපයෝජනය කළ මුදලක් ලෙස දෝෂ සහිතව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී මූල්‍යමය නොවන වෙන් කිරීම් හැර අනෙකුත් සියළු අගයන් සැලකිල්ලට ගැනීම සිදුකරන ලබයි.ඒ අනුව මෙම ගැලපීම සිදු කර ඇත. | වර්ෂය තුලදී මුදලින් සිදුකරනු ලබන ලැබීම් හා ගෙවීම් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කළ යුතුය. |
| (ඈ) **2019** සැප්තැම්බර් මාසයේ දී සුගතදාස ක්‍රීඩාංගනයේ පැවැත්වීමට සැලසුම් කර තිබූ **31** වෙනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල සඳහා සුගතදාස ක්‍රීඩාංගනය වෙන්කරගැනීම වෙනුවෙන් ගෙවන ලද රු. **2,293,734** ක මුදල එම ක්‍රීඩා උත්සවය නොපැවැත්වීම හේතුවෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කිසිදු තහවුරු කර ගැනීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | **2021** වර්ෂයේදී පැවැත්වීමට නියමිත **33** වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල සඳහා දැරීමට අපේක්ෂිත වියදම් තුළින් මෙතෙක් ගෙවා ඇති මුදල හිලව් කර ගැනීමට හෝ යම් හෙයකින් මෙම ක්‍රීඩා උළෙල මෙහි පැවැත්වීමට නොහැකි වුවහොත් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයකර ගැනීමට හෝ හිලව් කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් වියදම කපා හැරීම වෙනුවට ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.5.4** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු ණයහිමි ශේෂය | **836,790** | **79,713,942** | **78,877,152** | ගිණුම් පිළියෙල කරනු ලබන අවස්ථාවේදී හඳුනාගත හැකි වූයේ රු. **836,790.00** ක මුදලක් පමණි. **2020** වර්ෂයේ සිට ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කිරීම සඳහා නියමිත පරිදි අදාල බිල්පත් ඉදිරිපත් කරන ලෙස තරුණ සේවා සමාගම වෙත උපදෙස් ලබා දී ඇත . | සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු මුදල නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය . |

**1.5.5 ඒකාබද්ධ කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර සමාගම විසින් 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම මේ වන විට ගිණුම් සකස් කර ඇත්තේ 2017 වර්ෂය දක්වා පමණි. ඒ හේතුවෙන් 2019 වර්ෂයට ජාතික තරුණ සේවා සභාව විසින් සකස් කරන ලද මූල්‍ය වාර්තාවට තරුණ සේවා සමාගමේ ගිණුම් ඒකාබද්ධ කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී තරුණ සේවා සමාගමේ ගිණුම් යාවත්කාලීන වන පරිදි අවශ්‍ය ගිණුම් සකස් කරන ලෙස දැනටමත් කළමණාකරණය වෙත දැනුම් දී ඇත. | සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ මූල්‍ය තොරතුරු සමග ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් රඳවා ගැනීමේ ගිණුම තුළ වසර 05 කට අධික කාලයක් තිස්සේ පවතින එකතුව රු. 921,814 ක් වූ ශේෂය සහ වසර 03 කට වඩා පැරණි එකතුව රු. 1,873,036 ක් වූ විවිධ ණයහිමි ශේෂයන් නිරවුල් කරලීම සඳහා ආයතනය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | නිල්වලා තුරුණු උයන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට හා උතුරු පළාතේ පුනරීන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාල රඳවා ගැනීම් නිදහස් කිරීමට අවශ්‍ය මුදල් නොමැති වීම නිසා ශේෂය නිරවුල් කිරීමට නොහැකි විය. | දීර්ඝ කාලෙක සිට පැවතෙන ණයශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1999 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයන්ට ගෙවීමට හැකියාව තිබුණද ඊට පටහැනිව ක්‍රීඩා සමාජයේ කටයුතු කිරීම වෙනුවෙන් නිලධාරීන් පස් දෙනෙකුට 2019 ජනවාරි සිට 2020 ජනවාරි දක්වා එකතුව රු. 228,900 ක් ගෙවා තිබුණි. | ක්‍රීඩා සමාජයේ එවකට සිටි නිලධාරින් විසින් මෙම වැයදැරීම් සිදු කර ඇති අතර මේ පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිසංවිධාන කටයුතු සිදු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර කමිටු නිර්දේශ ලද පසු අවශ්‍ය සංශෝධන සිදුකිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 198,007,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.330,627,000ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 132,620,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට තරුණ සංවර්ධන වියදම් හා ආයතන හා පරිපාලන වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2017 වර්ෂය තුළ මුද්‍රණය කරන ලද පිරිවැය රු. 1,822,400 ක් වූ තරුණ තොරතුරු පත්‍රිකා 268,000 ක් ඉවත් කිරීමට නිර්දේශ කර තිබුණි. අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනිමකින් තොරව හා රාජ්‍ය මුදල් අරපිරිමැසුම්දායක ලෙස හා ඵලදායීව යොදා නොගැනීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 අනුව අදාල වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේදී මුද්‍රණය කරන ලද තරුණ අත්පත්‍රිකා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය මඟින් පරික්ෂාවක් සිදු කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කරන ලද සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් 40 ක අයිතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පවරාගෙන නොතිබුණි. | සභාව විසින් භුක්ති විඳින ඉඩම් 40 ට අදාල පවරා ගැනීම් සඳහා වන කටයුතු කිරීම් අඛණ්ඩව සිදු කරගෙන යන අතර, එම කටයුතු කඩිනමින් කර ගැනීම ඉතා අපහසු කරුණක් බව සඳහන් කරමි. කෙසේ වෙතත් මෙම ඉඩම් පවරා ගැනීම සඳහා රජයේ පවත්නා නීති රීති වලට අනුව පවරා ගැනීමට කටයුතු කරන බව තවදුරටත් සඳහන් කරමි. | සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම්වල අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට බාහිර ආයතන 04 කින් ලබාදී තිබූ එකතුව රු. 4,959,409 ක අරමුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අදාල කාර්ය සඳහා උපයෝජනය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් ලෙස පැවැතියද සත්‍ය වශයෙන් මෙම මුදල් නොපවතින බැවින් ඉදිරියේදී ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර රජයේ ආදායමට ගැනීම සඳහා කටයුතු කරනු ඇත. | ලබා දී ඇති ප්‍රතිපාදන අදාල අරමුණ සඳහා උපයෝජනය කළ යුතුය. |

**3.4** ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී ඉදිකිරීම් ව්‍යාපෘති 2 ක් සඳහා සැලසුම් සකස් කිරීම සඳහා රු. 2,613,779 ක් වැයකර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. | අවශ්‍ය ප්‍රතිපාදන මේ වනතෙක් නොලැබීම නිසා ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වුනි. භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන්වූ පසු මේ සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඉටු කරන බව දැනුම් දෙමි. | ව්‍යාපෘති සඳහා සභාව වෙත ලැබෙන ප්‍රතිපාදන උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනිම කෙරෙහි කළමනාකරනයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ රු. 84,216,614 ක් වැය කර තිබූ ව්‍යාපෘති 2 ක් කොන්ත්‍රාත්කරු විසින් වැඩ ප්‍රමාද කිරීම හේතුවෙන් 2018 අගෝස්තු සිට වැඩ නවතා දැමීමට කටයුතු කර තිබූ අතර එම ඉදිකිරීම් සම්බන්ධයෙන් නැවත වැඩ ආරම්භ කිරීමක් සිදුකර නොතිබුණි. | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මගින් ඉතිරි මුදල් නොලැබීම නිසා ලව්ලේන් හා දඹුල්ල පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීමේ ඉතිරි කොටස ආරම්භ කිරීමට නොහැකි වුනි. ඉදිරියේදී මේ සඳහා ප්‍රමුඛතාවය ලබා දී කාර්යය ඉටුකරන බව දැනුම් දෙමි. | නිසි අධීක්ෂණයකින් යුතුව ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති නිම කිරිමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක කරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා රු. මිලියන 372.75 ක් වැයකර තිබූ අතර එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් සම්බන්ධව ඇතිකරගත් ගිවිසුම් අනුව වැඩ අවසන් කළ යුතු | මෙම ව්‍යාපෘති 2017 හා 2018 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති වේ. මෙම ව්‍යාපෘති වල 2018 සැප්තැම්බර් සිට ඉදිරිපත් වූ බිල්පත් වලට මුදල් ගෙවීමට නොහැකි වීම හා Covid 19 වෛරස තත්වය නිසා ඇති වූ බාධාවන් නිසා නියමිත ප්‍රගතියක් | ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් පිළියෙල කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතුය.එමෙන්ම ගිවිසුම්ගත කාලය තුළදී ව්‍යාපෘති නිමකර ගැනිම කෙරෙහි |

| | | |
|---|---|---|
| කාලය අවසන් වී වසරකටත් අධික කාලයක් ගතවී ඇතත් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට **13** සිට සියයට **61** දක්වා පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | ලබා ගැනීමට නොහැකි වී ඇත. හලාවත පුහුණු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තුවට අදාල රු.මිලියන**20.95** ක මුදල ගෙවීමට නොහැකි වීම මත මෙම කොන්ත්‍රාත්තුව ගිවිසුම් ප්‍රකාරව තාවකාලිකව නතර කර ඇත. | කළමනාකරණයේ අවදානය යොමුවිය යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් **16** කට අදාලව ප්‍රමාණ පත්‍රිකාවේ ගෙවීම් කිරීමේ ක්‍රමවේදය අනුව "අදාල ලේඛන භාරදීමෙන් පසුව එම රක්ෂණාවරණ සහ සුරක්ෂණ හා බැඳුම්කර ලබාගැනීමට දරන ලද සත්‍ය පිරිවැය මත සියයට **5** ක වට්නාකමක් එකතු කර ගෙවීම් කිරීම" ලෙස සඳහන් කර ඇතත් එය නොසලකා හරිමින් කොන්ත්‍රාත්කරුවාගේ ශ්‍රමිකයන් සඳහා වන වන්දි රක්ෂණාවරණය සඳහා එකතුව රු. **1,147,245** ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද කොන්ත්‍රාත්කරුගේ ලංසු වටිනාකම මත ද එකතුව රු. **4,253,750** ක් ගෙවා තිබුණි. | සෑම ඉදිකිරීම් ව්‍යාපෘතියකටම අදාලව කොන්ත්‍රාත් ගිවිසුම් මගින් දෙපාර්ශවය ගිවිසගත් අයිතමයට අදාළ මිල වටිනාකම පමණක් ගෙවීම් කර ඇත. ගෙවීම් ක්‍රමවේදයේ නිවැරදිතාවය වැඩිදුරටත් තහවුරු කර ගැනීම සඳහා **2021/03/29** දින ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කරන ලදි. | ප්‍රමාණ පත්‍රිකාවේ ගෙවීම් කිරීමේ ක්‍රමවේදය අනුව ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ)පිරිවැය රු. **62,942,058** ක් වැයකර (අවසන් ගෙවීම හැර) ඉදිකරන ලද මහරගම තරුණ සේවා මධ්‍යස්ථානයේ පිහිනුම් තටාකයට අදාල පළමුව තෝරාගත් උපදේශක ආයතනය මඟින් අදාළ කාර්යය ඉටුකර නොගැනීම හේතුවෙන් වෙනත් උපදේශක ආයතනයක් මඟින් එම කාර්යය ඉටුකර ගැනීම හේතුවෙන් රු. **2,870,400** ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | පළමු උපදේශක ආයතනය සකස් කරන ලද සැලසුම්, ඇස්තමේන්තු හා ටෙන්ඩර් ලේඛණ වල පැවති අඩුපාඩු තාක්ෂණික ඇගයීම් කමිටුව පෙන්වා දීම පිළිනොගැනීම නිසා පැන නැගුණු තාක්ෂණික අවධානම් තත්වය හේතු කොට ගෙන උපදේශන සේවා මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් **standard conditions of engagement part I & II – ICTAD CONSULT 01** හි වගන්ති **2:10** ට අනුව ඉවත් කිරීම් කටයුතු සිදු කර , එහිම වගන්ති **2:10:5** අනුව ඒ දක්වා ඉටු කරන ලද සේවා සඳහා ගෙවා අවසන් කරන ලදී. | ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් පවතින පරිපාලනමය දුර්වලතා සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකර ඒවා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6** මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය තුළ සිවිල් ඉංජිනේරුවරයකු සඳහා අනුමත තනතුරක් පැවතියද ඒ සඳහා සුදුසුකම් ලත් නිලධාරියකු බඳවාගැනීමටද කටයුතු කිරීමෙන් තොරව **2017** වර්ෂයේ සිට **2020** වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සභාව විසින් ව්‍යාපෘති **20** ක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණ හා සැලසුම් කිරීම වෙනුවෙන් උපදේශක ආයතනවලට එකතුව රු. **36,182,728** ක් ගෙවීම් කර තිබුණද ඉදිකිරීම් කටයුතු නියමිත කාල රාමු තුළ නිම කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට පුරප්පාඩුව පවතින සිවිල් ඉංජිනේරු තනතුර සඳහා බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | අනුමත තනතුරු සඳහා සුදුසු නිලධාරින් බඳවා ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) අනුමත සේවක සංඛ්‍යාව **1449** ක් වුවද, එදිනට පුරප්පාඩු තනතුරු **294** ක් වූ අතර ඉන් මාණ්ඩලික තනතුරු **35** ක් වසර **03** කට අධික කාලයක සිට පුරප්පාඩුවී පැවතුණි. | කළමනාකරණය විසින් අදහස් ඉදිරිපත් කර නොමැත. | අනුමත තනතුරු සඳහා සුදුසු නිලධාරින් බඳවා ගැනිමට කටයුතු කළ යුතුය. |

**4.** ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1** තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - **2030**" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ජාතික තරුණ සේවා සභාව විසින් තම විෂය පථයට ගැනෙන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගනිමින් **2021** වර්ෂයේ ජාතික තරුණ සේවා සභාවේ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ **2017** අගෝස්තු **14** දිනැති අංක **NP/SP/SDG/17** දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |